**මඩකලපුව මහා නගර සභාව - 2022**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මඩකලපුව මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන පුස්තකාල සඳහා සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාගලෙස ලැබී තිබූ රු.10,015,508ක් වටිනා පොත් 11,878ක් වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | මෙම මුදල් වර්ෂයේ වත්කමක් වශයෙන් දැක්වීමට කටයුතු කරන බව. | පුස්තකාල පොත් මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් වශයෙන් දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟව පැවති දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලින් අයවියයුතු ව්‍යාපාර බදු රු. 302,500 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදි කටයුතු කරන බව. | හිඟ මුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමන තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක් | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.3,115,424ක කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කර ඇති බව. | තැන්පත් මුදල් ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ (අධිකාරය 252) වගන්තිය 37(අ) | සිහිවටන ස්මාරක හෝ පිළිමයන් ඉදි කිරීමට ප්‍රථම අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ පිළිම 05 ක් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 156,875,725 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 153,674,005 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 41,000,000 | 46,577,956 | 36,727,599 | 44,644,197 | 36,000,000 | 42,796,971 | 31,311,721 | 34,793,840 |
| කුලී | 27,250,100 | 24,475,385 | 23,566,524 | 16,492,094 | 6,050,000 | 10,466,896 | 5,796,715 | 15,583,233 |
| බලපත්‍ර ගාස්තු | 16,511,000 | 23,152,047 | 23,740,059 | 2,066,751 | 15,000,000 | 13,491,807 | 12,220,807 | 1,654,762 |
| වෙනත් ආදායම් | 159,827,000 | 253,065,050 | 239,269,827 | 13,795,223 | 18,000,000 | 18,068,228 | 18,068,228 | - |
| **එකතුව** | **244,588,100** | **347,270,438** | **323,304,009** | **76,998,265** | **75,050,000** | **84,823,902** | **67,397,471** | **52,031,835** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **බලපත්‍ර ගාස්තු**<br>මහා නගර සභා ආඥා පනතේ 247(c) වගන්තිය ප්‍රකාරව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05 කින් අයකළ යුතු රු.302,500 ක් අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතියානුකූලව කටයුතු කරන බව. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| (i) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 63,253,640 ක් ලැබිය යුතුව තිබුණි. | මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇති බව. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුද්දර ගාස්තු උපලේඛන නොගැලපීම සහ බැංකුවේ තැන්පත් කළ බවට ලියවිලි නොමැතිවීම යන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා ඉකුත් වර්ෂ 05 ට අදාල රු. 30,177,650 ක මුද්දර ගාස්තු මුදලක් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා ලිපි යවා ඇති බව. | -එම- |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | රු. 2,639,099 ක් වැය කර සභාව විසින් ඉදි කර තිබූ කරුවප්පංකේනි මහජන පොල සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා බදු දීමට කටයුතු කර නොතිබුණි. | දැනට කටයුතු කර ඇති බව. | කරුවප්පංකේනි මහජන පොල බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභාව සතු කල්ලඩි ළමා උද්‍යානයේ ඉදිකර තිබූ කඩ කාමර 12 න් කඩ කාමර 09 ක් සමාලෝචිත වර්ෂයේ බදු දීමට කටයුතු කර නොතිබුණි. | අදාල කඩ කාමර සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් මෙතෙක් ලැබී නොතිබුණු බව. | කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් කට්ටි කර විකිණීමේදී සභාව වෙත ලැබුණු ඉඩම් 41 කින් ඉඩම් 16 ක් සඳහා පමණක් වැට මායිම් ලකුණු කර ඇත. අනෙකුත් ඉඩම් සභාවේ ඉඩම් ලෙස | ඉඩම් හඳුනාගෙන වැට මායිම් වෙන් කිරීමට කටයුතු කරන බව. | සභාවට අයත් ඉඩමක් බව මහජනතාවට දැනගැනීමට සැලැස්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුන්වා "මහා නගර සභාව සතුය" ලෙස නාම පුවරු සවි කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කර ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා වූ අත්පොතෙහි 4 පරිච්ඡේදයේ 4.2 වගන්තිය ප්‍රකාරව අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ ගොඩනැගිලි අනුමැතිය ලබා දීමේදී වාතාශ්‍ර සහ වැසිකිළි පහසුකම් සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගෙන් වාර්තාවක් ලබා ගතයුතු වුවද ඉකුත් වර්ෂ 05 ක කාලය සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගෙන් වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව ඉදිකිරීම් අයදුම්පත් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | ඉදිරියේදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සැලැසුම් කමිටු රැස්වීම්වලට සහභාගි කරවා ගැනීම සඳහා කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහා නගර සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් කට්ටි කර විකිණීමේදි සභාව වෙත පවරන ලද පර්චර් 97 ක ඉඩම් කැබලි පහක් හිටපු කොමසාරිස් විසින් තම සහ තමාගේ භාර්යාවගේ නමට 2003 සිට 2006 දක්වා කාලයතුල මාරු කර තිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වර්තාවේ සඳහන් කළද, සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව විසින් කටයුතු කර ඇති බව ලිපි මගින් අප වෙත දන්වා ඇති බව. | සභාව සතු ඉඩම් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ පිළිබඳව විනය බලධාරියා වෙත වාර්ථා කළ යුතුය. |
| (ඈ) | ලීටර් 14000 ඩීසල් ටැංකිය සහ ඩීසල් පොම්ප යන්ත්‍රයේ වටිනාකම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදි මූල්‍ය ප්රකාශනවල වත්කමක් ලෙස දක්වන බව. | වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | කල්ලඩි මහජන පුස්තකාලයේ පොත් 190 ක් අස්ථාන ගතවී තිබුණද, ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කරන බව. | වත්කම්වල සාධාරණ වටිනාකම ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ට්‍රැක්ටර් රථ සහ බවුසර් ඇතුළුව වාහන 50 ක් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදි කටයුතු කරන බව. | වාර්ෂිකව ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙනත් රාජ්‍ය ආයතනවලින් පරිත්‍යාග වශයෙන් සභාව වෙත ලැබී තිබුණු වාහන 18 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ලියවිලි නිවැරදි කර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | වාහන සභාවේ වත්කමක් වශයෙන් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වත්කම් 54 ක් සභාවේ වත්කම් වශයෙන් සමාලෝචිත වර්ෂයේ හඳුනාගෙන තිබුණද, ඒවායේ අයිතිය සනාථ කරන ලියවිලි සභාව සතුව නොපැවතුණි. | ඉදිරියේදි කටයුතු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු සහ අතිරික්ත**<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙහි තනතුරු 33 ක පුරප්පාඩු 164 ක් සහ අතිරික්ත 09 ක් විය. | කාලීනව කාර්ය මණ්ඩල විස්තර අතිරේක ප්‍රධාන ලේකම් වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමට සහ අතිරික්තය විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **සේවක ණය**<br>මිය ගිය, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සහ අනෙකුත් සේවකයෙන් ගෙන් අයවිය යුතු රු. 594,147 ක් හිඟ සේවක ණය අයකර ගෙන නොතිබුණි. | මෙ සම්බන්ධව කටයුතු කර ඇති බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2000 වර්ෂයේ අංක 56 දරණ පනතෙන් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික ආරක්ෂක පනත අනුව තිරුප්පෙරුම්තුරෙ සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබා ගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක BMC/com/Gen/Sec.2022 හා 2022 ජුනි 20 දිනැති ලිපිය අනුව කොමසාරිස් විසින් National Engineering Research and Development center (NERD) කල්ලියංකාඩු සුසාන භූමියේ ආදාහනාගාරය සම්බන්ධයෙන් පරිසර ඇගයීම් වාර්තාවක් සඳහා ඉල්ලුම් පතක් යවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එය සභාවට ලැබී නොතිබුණි. | පරිසරයට හාණි නොවන ආකාරයට චිමිනි සහ කුටීර ඉදි කර ඇති බව. | ව්‍යාපෘතියේ බලපෑම් සම්බන්ධයෙන් පරිසර ඇගයීම් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |